## ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගම - 2017

---

ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 4 හි 4.5 වගන්තිය ප්‍රකාරව සමාගම සතු මාස 06 න් කල්පිරෙන රු. 5,802,607 ක ස්ථාවර තැන්පතුව ජංගම වත්කම් ලෙස වාර්තා කළයුතු වුවද, ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

සෝමාවතී ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබූ රු.25,000 ක අත්තිකාරම ජංගම වත්කම් යටතේ දැක්වීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස දක්වා තිබුණි.

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| රඳවාගත් බදු ( WHT ) | 75,767 | බදු සහතික |
| ලැබිය යුතු ආදායම් | 433,118 | ශේෂ සනාථන |

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) * විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

* සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත | |
| (i) 39 (1) වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, රේඛීය අමාත්‍යවරයා විසින් පත්කරන ආණ්ඩුවේ අධ්‍යක්ෂවරුන්ගෙන් සහ කොටස් හිමියන් පත්කරන කොටස්කාර අධ්‍යක්ෂවරුන්ගෙන් සැදුම්ලත් 07 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් හතර දෙනෙකුගෙන් සමන්විත සමාගමේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර තිබුණි. |
| (ii) 42 (1) වගන්තිය | සමාගමේ ප්‍රාග්ධනය රු. 100 සාමාන්‍ය කොටස්වලින් සමන්විත වියයුතු වුවද සමාගමේ සාංගමික සංස්ථාපත්‍රය පරිදි අනුදත් ප්‍රාග්ධනය රු.10 කොටස් 10,000,000 කින් සමන්විත වී තිබුණි. එයින් කොටස් 1,500 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට සහ කොටස් 2 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එවකට සිටි අධ්‍යක්ෂවරු දෙදෙනෙකු වෙත නිකුත් කර තිබුණි. |
| (iii) 45 (1) වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සමාගමේ සභාපතිවරයා තෝරා පත්කර ගතයුතු වුවත් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සමාගමේ සභාපතිවරයා පත්කර තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2015 ජුනි 17 දිනැති අංක 03 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 2.2 වගන්තිය | සමාගම් වර්ගීකරණයේ අනුකාණ්ඩ F යටතට ගැනෙන රජය සතු සමාගම්වල සභාපතිවරුන්ගේ මාසික දීමනාව ලබාගැනීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගතයුතු වුවත්, 2016 හා 2017 වර්ෂවලදී සමාගමේ සභාපතිවරයා ලබාගෙන තිබුණු පිළිවෙලින් රු.112,500 ක් හා රු.450,000 ක් සඳහා රේඛිය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 2.10 වගන්තිය | සභාපතිගේ මාසික දීමනාව හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් රැස්වීම්වලට සහභාගීවීමේ දීමනාවෙන් අදාල බදු මුදල් අඩු කළයුතු වුවද, සභාපතිට ගෙවන ලද රු.450,000 ක් හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුට ගෙවන ලද රු.54,000 ක රැස්වීම්වලට සහභාගීවීමේ දීමනාවලින් අඩු කළයුතු රඳවා ගැනීමේ බදු මුදල වූ රු.50,400 ක් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (iii) | 2.11 වගන්තිය | රැස්වීම් දීමනාව ගෙවිය යුත්තේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට පමණක් වුවත්, සමාගමේ ගණකාධිකාරීවරයාට හා කළමනාකරුට රැස්වීම් 03 ක් සඳහා රු. 6,000 ක් රැස්වීම් දීමනා ලෙස ගෙවා තිබුණි |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,380,891 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.814,640 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,195,531 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සේවක පාරිශ්‍රමිකය රු. 974,725 කින් ඉහළයාම හා සමාගමේ ආදායම රු.1,904,205 කින් පහල යාම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට මූලික වශයෙන් හේතු වී තිබුණි.
සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.785,270 ක් වූ සමාගමේ බදු පසු ශුද්ධ ලාභය 2017 වර්ෂයේදී රු.1,380,891 ක බදු පසු ශුද්ධ අලාභයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය හා බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.1,428,383 ක්ව පැවති සමාගමේ දායකත්වය 2014 වර්ෂයේදී අඩුවී 2015 හා 2016 වර්ෂවලදී වැඩිවී සමාලෝචිත වර්ෂයේදී රු.689,414 ක් ලෙස අඩු වී තිබුණි

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 4.1 කාර්යසාධනය

----------------

ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත සිදුකරන භූමි සමීක්ෂණ, ගුවන් ඡායාරූපකරණය, චන්ද්‍රිකා ඡායාරූපකරණය භූගෝලීය තොරතුරු පද්ධති සහ ගෝලීය පිහිටීම් පද්ධති මගින් පස්, භූමි අකෘති, භූ ලක්ෂණ,ඉඩම් භාවිතය, වෘක්ෂලතා, ජෛව විවිධත්වය, භූමි හිමිකාරීත්වය, ජලයේ ගුණත්වය ආදී පාරිසරික පරාමිතීන් සිතියම්ගත කිරීම, විශ්ලේෂණය හා විස්තර කිරීම හා භූ සම්පත් තක්සේරුව සහ භූ පරිහරණ සැලසුම්, පාංශු ඛාදනය සහ පාංශු සංරක්ෂණය, ආරක්ෂිත ප්‍රදේශ කළමනාකරණය, ශාක ඖෂධ වගාව සහ තිරසාර කාබනික වගා පද්ධති සඳහා අවශ්‍ය උපදෙස් දීම, සැලසුම් සකස්කිරීම, පුහුණුකිරීම සහ තාක්ෂණික උපදෙස් සැපයීම සාංගමික සංස්ථා පත්‍රය අනුව සමාගම පිහිටුවීමේ මූලික පරමාර්ථ වූ අතර පාරිසරික වාර්තා ලබාදීම සමාගමේ ප්‍රධාන කාර්යයක් වී තිබුණි. ඒ සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම සහිත කාර්යය මණ්ඩලයක් සමාගම සතු නොවූ බැවින් බාහිර පාර්ශවයකින් පාරිසරික වාර්තා සකස්කර ලබාගන්නා අතර එම වාර්තාවල නිවැරදිභාවය සහතික කිරීමේ හැකියාවක් හෝ සමාගම සතු නොවීය.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

සමාගමේ කාර්ය මණ්ඩලය 03 දෙනෙකුගෙන් සමන්විත වූ අතර සමාගම සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක් හා ඊට අදාළව බඳවාගැනීමේ කාර්යය පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් හෝ අනුමත කරගෙන නොතිබුණි. මේ හේතුවෙන් සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා බඳවාගැනීම්, උසස් කිරීම්, තනතුරුවලට අදාල සුදුසුකම් සහ වැටුප් තීරණය කිරීම්වල නිවැරදිභාවය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

## 5.1 සමාගම පිහිටුවීම

-------------------

1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතට අනුකූලව 1999 ජූලි 20 දින සිට බලපැවත්වෙන පරිදි පෞද්ගලික සමාගමක් ලෙස 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබූ මෙම සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2008 ජූනි 16 දින නැවත ලියාපදිංචි කර තිබුණි

## 5.2 සංයුක්ත සැලැස්ම

-------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව සමාගම පිහිටුවීමේ අරමුණු ඉටුකරගැනීමට අදාලව සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

-------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සමාගමේ කාර්යයන් කාර්යක්ෂමතාවයකින් මෙහෙයවීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස්කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇතැම් ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. |
| (ආ) | සැලසුම් සකස් කිරීම | අරමුණු ඉටුකර ගැනීම සඳහා සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලසුම් සකස් නොකිරීම. |
| (ඇ) | කාර්යසාධනය | සාංගමික සංස්ථාපත්‍රයේ සඳහන් අරමුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම. |
| (ඈ) | කාර්යමණ්ඩල පරිපාලනය | සමාගම සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක් හා බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර ගෙන නොතිබීම. |